ඉරිදා ලංකාදීප පුවත්පතේ (08/08) "ස්කූටියෙන් ඉගිලෙන කිරිල්ලියන්ට පාඩම් ටිකක්" යන සිරස්තලයෙන් යුතුව ස්කූටර් පදවන අයට උපදෙස් මාලාවක ආකාරයෙන් ලිපියක් ඉදිරිපත් වී තිබිණි. බැලූ බැල්මට මෙහි උපදෙස් ඉදිරිපත්ව තිබුණේ ස්කූටර් පදවන "කාන්තාවන්ට" මිස ස්කූටර් පදවන "පිරිමින්ට" නොවේ. කෙසේ නමුත් ගැටළුව වන්නේ, මෙහි දැක්වෙන බොහෝ ඒකාකෘතික කිරීම් කෙතරම් සාධාරණද යන්නයි.

උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, "ස්කූටියෙන් ඉගිලෙන සුන්දර රුවැත්තියන් ස්කූටිය කැඩුණු පසු හදාගන්න දන්නවාද" යන්න ප්‍රශ්නයක් යැයි මෙහි දැක්වේ. නමුත්, එසේ කාන්තාවන් විෂයෙහි පමණක් ඒකාකෘතික කෙරෙන්නේ, ස්කූටි/යතුරු පැදි පදවන සියළුම පිරිමින්ට ස්කූටිය/යතුරුපැදිය කැඩුණ හොත් සාදාගැනීමට හැකි යැයි උපකල්පනය කරමින් නොවේද? එය කෙතරම් දුරට සත්‍ය කරුණක්ද?

""මම ලස්සනයි, මගේ දිහා අර කොල්ලා බලන් ඉන්නවා. අර වාහනයේ අයියා මා දිහා බලන් ඉන්නවා. මම ලස්සනට වාහනය පදින්න ඕනෑ" මේ ආකාරයට සිතා කලබල වී සිත නොසන්සුන් කරගෙන ඉදිරියෙන් ධාවනය වන වාහනයේ තම යතුරුපැදිය හප්පා ගත් අවස්ථාද වාර්තා වී ඇත" යනුවෙන්ද මෙම ලිපියේ දැක්වේ. මේ ආකාරයේ භාවාතිෂය සඳහන් කිරීම් මගින්ද කාන්තාව තවදුරටත් ඒකාකෘතික නොකෙරෙන්නේදැයි අප ඇසිය යුතුවේ.

පාඨකයින් ලෙසින් අප විමසිය යුතු ගැටළුව වන්නේ මෙයයි. මෙවැනි ඒකාකෘතික කිරීම් ඔස්සේ සැබවින්ම කාන්තාව ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කොන් කිරීමකට ලක් නොකෙරෙන්නේද? එසේ නම්, මෙවැනි ලිපියක් කෙතරම් මාධ්‍ය ආචාර ධර්මානුකූල යැයි අපට කිව හැකිද?

**#MediaEthicsSL #lka #sinhalanews #SundayLankadeepa**